

ඈත්තක් විය හැකි

# හෘද සාක්ෂිය


## හදවතට සිතක් තිබේ ද?

හදවතට සිත පිළිබඳව උරුමකම් කිවහැකියි යන ආකල්පය මුල්කරගත් 'මුළු හදවතින්ම මම ආදරය කරනව', 'හදවතින්ම මම එකඟ වෙනව' වැනි වදන් මාලාවක් ලෝකයට සුපුරුදු වූ මෙන්ම සාමාන්‍ය වූ දෙයකි. එවැනිම හැඟීමකින් යුතුව මම යන පුද්ගලයා හඳුන්වාදීමකදි අපේ අත කෙලින්ම අපි හදවත දෙසට යොමු කරවමු. හෘද සාක්ෂිය යනුවෙන් හැඳින්වෙන යම්කිසි දෙයක් අන් සියල්ලම යටපත් කරමින් මතුවන අවස්ථා අපි අත්දකින්නෙමු. මේ සියලුම ප්‍රයෝගින වශයෙන් සත්‍ය වුනු කරුණු හා අත්දැකීම් දෙස වඩාත් ගැඹුරින කරුණු සෙවීමට පදනම වැටුනේ මෙසේයි:-

1988 වසරේ මැයි 29 වනදා යේල් රෑ නිව් හේ-වන් රෝහලේදී සිල්වියා ක්ලෙයා නමින් හැඳින්වෙන තැනැත්තියකට හදවත් බද්ධකිරීමක් සිදුවිය. ඇයට ලැබුනේ යතුරු පැදියක් මත සිදුවූ අනතුරක් නිසා අවසන් හුස්ම හෙලූ වයස අවුරුදු 18ක තරුණයකු ගේ හදවතකි. සාර්ථක හදවත් බද්ධකිරීමත් සමඟ සිහිය ලැබූ ඇයට තමාවෙත මෙතෙක් පැවති හැඟීම් සහ හුරුපුරුදු තුල සිදු වී තිබූ යම් වෙනස්කමක් දැනීගියේ ය. මේ මොහොතේ තමාට ලෝකයේ වඩාත්ම අවශ්‍යකරන්නේ කුමක්ද යන්නෙන් වාර්තාකරුවෙකු නැගූ ප්‍රශ්ණයකට ඇගේ ක්ෂණික පිළිතුර වූයේ 'බියර් වීදුරුවක්' බවයි. තමා මීට පෙර කිසිසේත්ම කැමැත්තක් නොදැක්වූ බියර් බීමටත්, චිකන් නගට් කෑමටත් ඇති ආසාව පසුපස තොරතුරු සොයාගිය ඇයට ඊට කාලයකට පසුව දැන ගන්නට ලැබුනේ තමාගේ හදවත් දායකයා මියයන මොහොතේ ද චිකන් නගට් තම කෝට් සාක්කුවේ දමාගෙන සිටිය බවයි.

## ආචාර්ය විද්‍යානි මනතුංග

විද්‍යාත්මක ලෝකය තුල බොහෝ දෙනා මෙය සිය මතකයෙන් ඉවත්කලේ එය එක්තරා අස්වාභාවික සිදුවීමක් පමණකැයි සිතමින්. තවත් සමහරෙක් හදවතට මතකයක් (සිතක්) ඇතැයි යන කරුණට විරුද්ධව අදහස් ප්‍රකාශ කරන්නට විය. ග්‍රාහකයා ගේ ශරීරයට බද්ධකරන හදවත ප්‍රතික්ෂේප කිරීම වැලැක්වීම සඳහා ලබාදෙන අධික බෙහෙත්




ප්‍රමානය නිසා ස්නායු වලට එයින් ඇතිවන බලපෑම මත මවාගත් දෑ ගැන හදවත් ග්‍රාහකයා කතාකරන බව කොටසක ගේ මතය විය. මානසික වෛද්‍යවරයකු වන පොල් පියසල් දක්වන්නේ එය රෝගියාට දීර්ඝ කාලයක් අමතකව තිබූ තමාගේ ම මතකයේ නැවත කැඳවීමක් බවයි. මේ ගැන තවත් කොටසක් අර්ථදක්වන්නේ ඊළඟ නවාතැනට පිටවී නොගිය හදවත් දායකයාගේ ආත්මය විසින් එය සිදුකරන බවයි. අනිත් තර්කය නම් පියවි සිහියටත් නිර්වින්දන බෙහෙත් නිසා ඇතිවන මත්බවටත් අතරමැදි තත්වයේ දී තමා අවට රාජකාරියේ යෙදී සිටින්නන් ගේ කතාබහ රෝගියා සිය මතකයේ තැන්පත්කර ගන්නා බවයි.

ඉතා දීර්ඝ කාලයක පටන්ම මතක තබාගැනීමේ හැකියාව ශරීරයේ ස්නායු පද්ධතියට මූලිකවත්, වසා පද්ධතියට යම් දුරකටත් ඇති බව අපි දැන සිටියෙමු. ඉගෙනීම, සංකීර්ණ තීරණගැනීම, තර්කානුකූලව සිතීම යන කරුණු මොළයේ පාලනයත් සමඟ පවතිනවාය යන්න තර්කයක් නොමැති සත්‍යයක් බවත් අපි දැන සිටියෙමු. නමුත් 10%-15% පමණක් වන හදවත් බද්ධකිරීම් සමඟ මෙසේ ඉස්මතුවන හදවත් ග්‍රාහකයන්ගේ වෙනස් ගතිපැවතුම් සමඟ දිගටම පර්යේෂණ මෙහෙයවූ විද්‍යාඥයන්ට ඉතා විශ්මය ජනක සොයාගැනීම් සඳහා තවතවත් ඉඩ සැලසෙන්නට විය.

ස්නායු පිළිබඳ විශේෂඥයෙක්වන කැනඩාවේ (මොන්ට්‍රියල්) දොස්තර ඇන්ඩෘ ආමඅ කුඩා නමුත් සංකීර්ණ ස්නායු ජාලයක් හදවතේ ඇතිබව සොයා ගත්තේය. ස්නායු සෛල හතලිස් දාහක් පමණ හදවතේ ඇති අතර මේ මගින් හදවතත් මොළයත් අතර ඉතා සූක්ෂම සහ සංකීර්ණ පණිවිඩ හුවමා රුවක් සිදුවන බවත්, කෙටිකාලීන සහ දීර්ඝකාලීන මතකය සඳහා හදවතේ ඇති මෙම ස්නායු විශේෂ වන බවත් ඔහු විසින් පැහැදිලි කරන ලදි. ඒ සඳහා ඔහු විසින් ඉදිරිපත් කරන ලද විද්‍යාත්මක තර්කය නම් මොළයේ මෙන්ම හදවතේද ස්නායු අවේග පිටවීමත් නැවත පැමිණීමත් යන ද්විත්ව පණිවිඩ හුවමාරුව හදවත් සෛල වල මතකය ගබඩා කිරීම සඳහා ඉවහල්වන බවයි.

බද්ධකරන හදවත එය ලබාදෙන දායකයාගේ ස්වයං මතකයත් සමඟ පැමිනෙන අතර, එසේ වීම ස්වභාවිකවම හදවත ලබාගන්නා තැනැත්තා තුල ද්විත්ව අනන්‍යතාවයක් ඇති කරයි. නමුත් සෑම කෙනෙක්ම එය තමාගෙන් වෙනස්වූ ස්වභාවයක් ලෙස වටහා නොගනී. ඉතා සුළු ප්‍රමානයක් පමණක් මෙවැන්නක් පිළිබඳව සඳහන් කිරීමට හේතු ලෙස ඔහු දක්වන්නේ සෑම කෙනෙක්ම තමාගේ සිත පිළිබඳව සියුම් ලෙස සිතන්නට යොමුවී නැති බවයි. ඒ පිළිබඳව මානසික වෛද්‍යවරයකුවන විලියම් ජේම්ස් කියන්නේ 'ඔබට සියලු හරකුන් කලු නොවන බව ඔප්පුකල යුතුනම්, එක හරකෙක් සුදු බව පමණක් ඔප්පු කිරීම ප්‍රමාණවත් බවයි.

හදවතින් පිටවන පීඩන තරංගත්, ස්නායු සහ රසායනික ද්‍රව්‍යත් මෙන්ම, හදවතේ සෑම ස්පන්ධනයක් සමඟම විද්යුත් චුම්බක තරංග ශක්තියක් හදවතේ සිට ශරීරය පුරාද, මොළයටද ගමන් කරයි. පුදුමය නම් හදවතේ ඇති විද්යුත් චුම්බක තරංග ක්ෂේත්‍රයේ ප්‍රමාණය මොළයේ ඇති විද්යුත් චුම්බක තරංග ක්ෂේත්‍රයේ ප්‍රමාණයට වඩා 5000 ගුණයකින් වැඩි බවයි. මේ ශක්තිය ශරීරයෙන් (හදවතින්) අඩි 5ක දුර සිට මනින්නට හැකියයි කීම කොතරම් පුදුමයක්ද? කෙසේ නමුත් විද්‍යාඥයන් සිතන්නේ මිනිස් ජීවිතයක ආරම්භක අවස්ථාව වන කලලය තුලදී මොළයටත් පෙර පණ ලබන මේ හදවතේ සංකීර්ණබව පිළිබඳව ලෝකය තවමත් අනාවරණය කරගෙන ඇති කරුණු ප්‍රමාණය ඉතාම අල්ප බවයි.

# සම්මාන ලබති

වික්ටෝරියානු රජයේ බහුවාර්ගික කොමිසමේ මෙහෙයවීමෙන් සමාජ මෙහෙවරෙහි නිරත වන පුද්ගලයන් සඳහාත් කැපී පෙනෙන සේවාවන් සැපයූ සංවිධාන සඳහාත් තිළිණ ප්‍රදානය කිරීමේ උත්සවයක් නොවැම්බර් 26 වන දින වික්ටෝරියානු රජයේ ආණ්ඩුකාරවරයාගේ නිවහනේදී පැවැත්වුණි. 200ක් පමණ වූ පිරිසක් හා සංවිධාන මෙහිදී අගැයුමට ලක් විය.



මේ සම්මාන ලාභීන් අතර ග්‍රීන්වේල්හි චන්ද්‍රසිරි දයාසෝම බමුණුසිංහ මහතාත් ඩැන්ඩිනොන් විහාරාධිපති පූජ්‍ය අකරවිට සංඝානන්ද හිමියනුත් විය. ස්කැට් සංවිධානයේ සේවය අගය කරමින් ඒ සඳහා වූ සම්මානය එහි වර්තමාන සභාපති ආචාර්ය සේනක පෙරේරා මහතා විසින් බාරගන්නා ලදී.

නර්තන කලාව වෙනුවෙන් කළ සේවය වෙනුවෙන් නිරුතා ඉන්දියන් ෆයින් ආර්ට් කලායතනයේ ආචාරිණී නිරුතා තර්මකුලේන්ද්‍රන් මහත්මිය ද සම්මාන ලබා ගත්තා ය.

සටහන හා ඡායාරූප
රත්නපාල දිසානායක

31 වන පිටෙන්

රන්මල සේම මම ලස්සන නැතුවාට
නාමල සේම සුදු රූපියල් නැතුවාට"
දැක්විය හැක.

ඕනෑම හැඟීමක් බාවාතිශය නොවී භාව උද්දීපනය වන අයුරින් නිර්මාණය කිරීම උසස් කවියෙකුගේ ලක්ෂණයකි. මෙහිදී කවිය නිරතුරුවම පුද්ගල වින්දනය පදනම් කොට ගත්තෙකි. නමුත් එය අර්ථවත් වින්දනයක් බවට පත් කළ හැක්කේ නිශ්පුද්ගල වින්දනයක් බවට පත්කල විටය. කොළඹ යුගයේ කවි රචනා අසාර්ථක වීමට හේතු වී තිබෙන්නේ සංයමයකින් තොර වීමයි. උදාහරණයක් ලෙස පහත කිවිය විමසා බලමු.

පෙම්මිණි කිරුළ ආලය කිරි වතුර ගඟ
කට ගෑවෙහිය ඔබ මා වෙත සැපත සග
උතුරයි ලයේ නොයිඳුල් අම රසය නැග
මැරුණත් සැපයි මම මින්පසු ඔබගෙ ළඟ"

කවියාගේ අත්දැකීම් වචන මගින් සියුම්ව ඉදිරිපත් කිරීම මගින් පාඨකයාගේ අත්දැකීම් වැඩිවෙයි. කොළඹ යුගයේ කවීන් බොහෝ දෙනෙක් රොමැන්ටික් කවීන්ය. ප්‍රේමය සුන්දර අද්භූදයක් බවට පත්කොට අතිශය ඔලාරික ලෙස නිරූපනය කළහ. මෙසේ පුද්ගල අත්දැකීම් පාදකකොට ගත් අත්දැකීම් අසාර්ථක වී ඇත්තේ පුද්ගලානුභූතිය තුලින් කාව්‍යානුභූතිය මතුකොට දැක්වීමට කවීන් අපොහොසත් වූ නිසාය. ජනකවිය හඬ නගා කියවා රසවිඳින හෙයින් ඒවා කවුරුත් අසා සිටියත් ගැටළුවක් ඇති නොවන අයුරින් මහා සංයමයෙන් කවි නිර්මාණය කොට ඇත. පහත කවිය විමසීමෙන් ඒ බව පැහැදිලි වේ.

දුර එනකොට වැටකෙයියා මලක් වගෙයි
ළඟ එනකොට රිදියෙන් කළ වැඩක් වගෙයි
ගෙට එනකොට ගෙයි ඇවිගෙන පාන වගෙයි
මගෙ මැණිකේ මට මානෙල් මලක් වගෙයි"

ගැමි තරුණයෙක් තම ප්‍රියාවියගේ සුන්දරත්වයත්, ඇය ලදොත් තමාගේ ජීවිතය සාර්ථක වනබව පවසයි. මේ ආදී වශයෙන් ප්‍රේමය, විරහය වැනි මනෝභාවයන් පදනම් කොටගත් කවි මහාසංයමයෙන් නිර්මාණය කොට ඇත. මෙමගින් මහා සිරිත් විරිත් වලින් සාරධර්ම වලින් හැඩගැසුනු ගැමි ජනතාවගේ ශික්ෂන ජීවන ක්‍රමය මනාව පැහැදිලි වේ.

මේ අනුව අපට ගැමි සමාජයේ අව්‍යාජ සිතුම් පැතුම් කෘෂිකාර්මික පදනමක් ඇති නිරවුල් දිවිපැවැත්මක්, බෞද්ධාමික මුහුණුවරක් ගත් ආකල්ප ක්‍රියාකාරකම් සැපේදී පමණක් නොව දුකේදී ද සාමූහිකව විඳදරා ගැනීම ගැමි පරිසරයේ සුන්දරත්වය දුටු ආකාරය ප්‍රේමය විරහය වැනි මනෝභාවයන් වලදී ගැමියන්ගේ මනා සංයමය ජනකවිය මගින් අපූරුවට නිරූපනය කොට ඇත. එම නිසා ජනකවි සාහිත්‍යය සිංහල ගැමි සමාජය නිරූපනය කැන කැඩපතක් වැනි යැයි කිව හැකිය.

## සන්නස සංස්කාරක වෙත

පසුගිය ජූලි මාසයේ සන්නස පුවත්පතේ මා නමින් පළ වී තිබූ ලිපියක් සම්බන්ධයෙන් මරීනා එදිරිවීර මහත්මිය විසින් ලියා සන්නස පසුගිය කළාපයේ පළ වූ ලිපිය සම්බන්ධයෙන් යම් කරුණු පැහැදිලි කිරීමක් කිරීමට කැමැත්තෙමි.

පළමුව ඇය සඳහන් කරන ලිපිය මා විසින් සන්නස පුවත්පතට ලියන ලද ලිපියක් නොවන බව සඳහන් කරනු කැමැත්තෙමි. මගේ නමින් පලවී තිබූ මේ ලිපිය ශ්‍රී ලාංකික ගායක ගායිකා-වන්ගේ වික්ටෝරියා සංගමය (VASS) මාධ්‍ය වේදීන් වෙනුවෙන් පැවැත් වූ සුහද හමුවේ දී එම සංගමයේ සභාපති වශයෙන් ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික පුවත්පත් හා ගුවන් විදුලි සේවාවන් ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට ඇප කැප වූ ශ්‍රී ලාංකිකයන් පිළිබඳ ව මා කළ දේශනයයි. මෙම දේශනය සංගමයේ ලේකම් විසින් පුවත් පත් වලට යොමු කරනු ලැබූ අතර සන්නසේ මගේ නමින් පළ වූයේ එම දේශණයයි.

මෙම ලිපිය පළවීමෙන් පසුව මා ඇමතූ මරීනා එදිරිවීර මහත්මිය මරීනා හා කිංසිලි ගේ නම් මෙහි සඳහන් නොවීම පිළිබඳව මට චෝදනා කළා ය. මම මා අතින් සිදු වූ එම අතපසුවීම පිළිබඳව මගේ කණගාටුව නොපැකිළ ඇයට ප්‍රකාශ කර සිටියෙමි. කිංසිලි හා මරීනා දෙපළ සිංහල ගුවන් විදුලිය සිංහල පාසල වැඩිහිටි මාසික හමුව සිංහල නාට්‍ය කලාව උදෙසා කළ මෙහෙය අප කවුරුත් දන්නා බැවින් මම අවංකවම මගේ කණගාටුව ඇයට ප්‍රකාශ කර සිටියෙමි. එසේ මගේ කණගාටුව ප්‍රකාශ කිරීමෙන් පසුවත් ඇය එම කරුණාම මෙසේ පුවත් පතකට යොමු කිරීම පිළිබඳව මම ඉමහත් කම්පාවට පත් වුණෙමි.

සමාජ සේවා කටයුතු කිරීමේදී ඕනෑම කෙනෙකු අතින් යම් යම් අතපසුවීම් සිදුවීමට ඉඩ ඇති බව ඇය ද නොදන්නවා විය නොහැකි ය. එසේ සිදුවූ අතපසු වීමක් පිළිබඳව අදාල පුද්ගලයනට කණගාටුව ප්‍රකාශ කිරීමෙන් පසුවත් මේ ආකාරයට කටයුතු කිරීම කොයි තරම් දුරට ගැළපේ දැයි සිතා බැලීම වටී.

අප යමක් කරන්නේ අපේ නම් ප්‍රසිද්ධ කර ගැනීමේ අරමුණෙන් නොවේ. යහපත් දෙයක් කර අපේ සමාජය එයින් යහපතක් විඳිනවා බලා සතුටුවීම පමණකි අපේ අරමුණ.

දයා සිල්වා